සමාජයේ යම් කිසි අතීත කාලයක භාවිතා වූ ඇතැම් යෙදුම්, එම අතීත කාලීන සමාජයේ පැවතුණු යම් යම් පසුගාමී සමාජ සම්බන්ධතාවයන් හා පර්යාය වූවා විය හැක. කෙසේ නමුත් එම පසුගාමී සමාජ සම්බන්ධතා වර්තමානය වන විට වඩාත් නිදහස්, වෘත්තිය සම්බන්ධතාවයන් බවට පත්ව තිබෙනා විටත්, එම පසුගාමී සමාජ සම්බන්ධතාවයන්ම සිහිපත් කරවන යෙදුම් භාවිතා කළ යුතුද? එම යෙදුම් අදට නොගැලපෙන්නේ නැතිද?
මෙසේ පැවසෙනුයේ "මෙහෙකාරිය" වැනි යෙදුම් සම්බන්ධයෙන් වේ. විශේෂයෙන්ම මෙහෙකරුවා/වැඩකරුවා සහ හාම්පුතුන් අතර තිබූ සම්බන්ධතාවයක් තවදුරටත් දක්නට නැතිවා නොවේද? වර්තමානය වන විට එම සබඳතා සේවානියුක්ත-සේවායෝජක වැනි වඩාත් වෘත්තිමය සම්බන්ධතාවයන් බවට පත්ව තිබෙනවා නොවේද? ඒ අනුව ගත් විට, 'මෙහෙකාරිය' වැනි යෙදුමක් වෙනුවට වඩාත් උචිත වන්නේ "සේවිකාව" වැනි යෙදුමක් යැයි ඔබ නොසිතන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa